# චාලිස් මාමා (කෙටි කථාව)

"පොඩි පුතේ අපි යමුද චාලිස් මාමගෙ ගෙදර ගිහිල්ල එන්න."

මෙය ඇසුණු රංගසිරි කඩිමුඩියේ ඇඳුම් මාරු කොට ආවේ එහි ගිය හැම විටෙකම ලැබෙන සත්කාරත්, කරුණාවතී අක්කා සමග සෙල්ලම් කිරීමට ලැබෙන අවස්ථාවත් නිසාය. චාලිස් මාමාගේ ගෙදර පිහිටියේ කුඹුරකින් වටවූ කුඩා කඳු ගැටයකය. නියර දිගේ ඇවිදීමට ආශා කළ රංගසිරි ගෙදරට ගිය පසු පෙනෙන දර්ශනයට ඉතාමත් ලැදිකමක් දැක්විය. ගෙදර ඇති විශේෂ කෑමක් ලැබෙන බවත් රංගසිරි දැන සිටියේය.

රංගසිරිගේ පියා ගමේ මහ විහලේ විදුහල්පතිවරයාය. ජාතික ඇඳුමෙන් සැරසුන තාත්තාගේ අත අල්ලාගත් රංගසිරි ඇවිද්දේ උජාරුවෙනි.

"ජයදාස ලොකු මහත්තයයි රංගසිරි පොඩි මහත්තයයි උදේම බෑරක් යනව වගෙයි."

"නැහැ කරෝලිස් අයියෙ- මම අපේ චාලිස් මල්ලිව ටිකක් බලල එන්න යනව. හුග දොහොකින් දැක්කෙත් නැහැ. උන්නැහෙට ටිකක් අසනීප ගතියකුත් තියෙනව කියල ආරංචි උනා."

"කොහොමද කරෝලිස් අයියෙ ළමයි එහෙම?"

"ලොකු දුව ලඟකදි දීගෙක යනව. ලොකු පුතා මා එක්ක කුඹුරෙ-හේනෙ වැඩ කරනවා. පොඩි පුතා නම් ඉගෙන ගන්න හරිම දස්සය. තව ටිකක් ඉහළට උගන්නන්න තමයි ඉන්නේ."

"ඇස්වහක් කටවහක් නැහැ මහත්තයො, ඔබතුමා ගමට-ඉස්කෝලෙට ආපු දා ඉඳල ගමේ ළමයි හරිම උනන්දුවෙන් ඉගෙන ගන්නවා. උන්ගෙ වාසනාව තමයි මහත්තයො, ඔබතුමාගෙ කරුණා ගුණය නිසා වෙන්න ඇති. හරිම වාසනාවක් අපිට."

"නෑ කරෝලිස් අයියෙ, මම මගේ සේවෙ හරියට කරනව විතරයි. මොකද අපිට ආණ්ඩුවෙන් පඩියක් ලැබෙනව නේ. ඒ පඩියට වඩා අපි සේවය කළේ නැත්නම් අපි ලබන ආත්මෙදි ණයකාරයො වෙනව."

"ඔහොම හිතන අය අද හරි අඩුයි මහත්තයො, හැමෝම බලන්නෙ අඩු වැඩ- වැඩි පඩි."

"මුළු රටේම-මුළු ලෝකෙම අනාගතය රඳ පවතින්නේ මේ පොඩි දරුවො නිසා, මේ අය හොඳට ඉගෙන ගත්තම, සුචරිතව හැදුනම වැඩුනම, ලොකු උනාම හොඳ පුරවැසියො වෙනව. ඒකෙන් ගමටත්-රටටත්, මුළු ලෝකයටමත් වෙන සේවය කියල නිම කරන්න බැහැ. දැන් බලන්න අද හුගක් ඉහළ නිළ තලවල ඉන්නෙ කිසිම උගත්කමක් නැති, සදාචාරයක් නැති බොරු බණ කියන නායකයො. ඒව නැතිකරන්න නං හොඳින් ඉගෙන ගත් බුද්ධිමත් දූ දරු කැළක් අපි බිහි කරන්න ඕන. බුදු දහමේ අගය නිතරම කියා දෙන්න ඕන."

"අනේ වාසනාවන් - ඔබතුමා නං දෙවියෙක්. එහෙනම් මට යන්න අවසරයි අපේ ලොකු මහත්තයො."

රංගසිරිට මෙවැනි කතා බහ ඉතාමත් හුරු පුරුදුයි. ඉඳ හිට තම පියා සමග ගමේ ඇවිදීමට යන රංගසිරිට ඇතිවන්නේ හරිම ආඩම්බරයක්.

සතියකට වරක් නොවැරදීම පන්සලට යන ජයදාස ලොකු මහත්තයාට හාමුදුරුවන් වහන්සේගෙන් ලැබුණේත් හොඳ ආශීර්වාද.

ගමේ හැදී වැඩී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් උපාධියක් දිනාගත් පළමු තැනැත්තා වූ තාත්තාට රජයේ ඉහළ තනතුරු ලබා ගැනීමට හැකියාව තිබුණත් ඔහු ගුරුවෘතිය තෝරා ගත්තේ කුඩා කළ සිටම ගුරුවරයකු වීමට තිබූ ආශාව නිසා බව ඔහු නිතර පවසන අයුරු රංගසිරිට මතකය.

කර්ම-ඵල වාදය තරයේ විශ්වාස කරන තාත්තා නිතරම කියන්නේ තමා භවයෙන් භවයට ගුරු වෘතිය පුරුදු පුහුණු කළ අයෙකු බවයි. මේ බව සිතමින් යන රංගට චාලි මාමාගේ ගෙදරට යන පාර තිබූ නියරට ගොඩවන තුරු ගමන ගැන දැනුනේ නැත.

එක් වරම ඔහුගේ මතකයට ආවේ මීට වසර තුන හතරකට පෙර සිදු වූ සිදුවීමක්.

එකල පාරේ ගමන් කරන කාරයක් දකින්නේ හරිම කලාතුරකින්. රංගසිරි නිතර තාමාට කාරයක් එළවිය හැකි යැයි කියමින් දකින හැම විටම තමාට පාරේ යන කාරයක් ගෙන දෙන ලෙස පියාට ඇවිටිලි කරයි. දවසක් චාලිස් මාමාගේ ගෙදරට යන අතර මගදී සිදු වූ කතාවක් ඔහුට මතක් විය.

"තාත්තේ ඔන්න කාර් එකක් එනව. අද නම් මට කොහොම හරි ඕක අරන් දෙන්නම ඕන. එතකොට අපට ඇවිදින්න ඕන නැහැ. මම එළවගෙන ගෙදර යන්නම්."

"පුතාට කකුල් දිග තියෙනවයැ?"

"තාත්තෙ, ඔයා අරන් දීල බලන්නකො. මම පෙන්වන්නම්."

එදා කතාවෙන් කතාවෙන් චාලිස් මාමගෙ ගෙදරට ගිහිල්ල,

"බලන්නකො චාලිස් මල්ලියෙ, මේ රංගසිරි කියනව මට අර පාරෙ යන කාරෙකක් අරන් දෙන්න කියල. එයාට එළවන්න පුළුවන්ලු."

තාත්තා කිවේ සිනාසෙමින්.

රංගසිරිගේ දෑසට කඳුළු උනනු දුටු චාලිස් මාමා,

"පුතේ මම උඹට අපේ කාරෙක දෙන්නම්."

රංගසිරිට ඉවසුම් නොදෙන සතුටක් ඇතිවිය.

"ඉතින් දැන් දෙන්නකො මාමෙ, මට එතකොට ගෙදර යන්න පුළුවන්."

ගේ ඇතුළට ගොස් ආ මාමා කීවේ,

"පුතේ ඒක තියෙන්නෙ කරුණාවතී අක්කගෙ කාමරේ, එයා සනීප නැතුව නිදි. මම අනිත් දවසෙ ආවම පුතාට ඒක දෙන්නම්."

ඊට සති දෙකකට පමණ පසුව ලීවලින් සෑදූ කුඩා කාරයක් චාලිස් මාමා රංගට තෑගි කළේය. මේ නිසා ලොකු කාරයක් පිළිබඳ ආශාව රංගගෙන් නැතිව ගියේ ඔහු නිතරම මේ කාරය සමග සෙල්ලම් කළ නිසාය. රංගසිරි මින් ලැබුයේ අසීමිත සතුටකි.

තාත්තා දුටු කරුණාවතී අක්කා දුවවිත් තාත්තාට වැන්දාය.

''ආ රංග මල්ලි, මම එනකම් මේ බලාගෙන හිටියෙ. එන්න එන්න.''

කියා රංගව තුරුළු කර ගත්තේ ඉතාමත් සෙනෙහසිනි. මෙය දුටු නැන්දා,

''මට හිතෙන්නෙ අපේ ඉස්කෝලෙ අයියේ, මේ අපේ දුවයි රංග පුතයි ගිය ආත්මෙක තමන්ගෙම අක්කයි මල්ලියි වෙලා ඉන්න ඇති.''

කිවේ සතුටු කඳුළු පුරවාගෙන.

කරුණාවතී අක්කා රංගට වඩා කුලුපග වූයේ ඇයට වෙනත් සහෝදර සහෝදරින් නැති නිසා වෙන්න ඇති.

රංගගේ අක්කා ප්‍රියවතී කරුණාවතී අක්කා සමග එකම පංතියේ ඉගෙනුම ලබයි. කරුණාවතී අක්කාගේ පවුලේ සැමගේ ආදරය රංග වෙත ලැබී ඇති බව දැනගත් ප්‍රියවතී, සමග එහි යාමට අකමැතිය.

කේක් දීසියක් සමග රංග වෙත පැමිණි නැන්දා හිස අතගාමින් රංගට කේක් කවයි.

''මගෙ රංග පුතේ, පුතත් තාත්ත වගේ ඉගෙන ගෙන හොඳ ලොකු මහත්තයෙක් වෙන්න ඕන. ඒක අපටත් ලොකු නම්බුවක්.''

රංගව සිපගත් නැන්දා,

''අනේ මටත් මේ වගේ කොළු පැටියෙක් හිටිය නම්'' කීවේ කඳුළු අතරිනි.

''මොනව කරන්නද නෝනෙ. අපි ලබා උපන් හැටි තමයි. ඒත් අපට මේ රංග පුතා ඉන්නව නේ, අපේම දරුවෙක් වගේ.''

මාමා එසේ කීවේ සරසාර කුඹුරට උඩින් පෙනෙන නිල් අහස දෙස බලමින්.

එය රංගගේ සිතට තදින්ම කා වැදුනි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන කළ, ගමට එන සැම දිනකම චාලිස් මාමාත්, නැන්දාත්, කරුණාවතී අක්කා හා ඇගේ දරුවනුත් නොබලා නැවත යාමට රංගට නොහැකි විය.

''අම්මේ අම්මේ අන්න අපේ රංග මාමා එනවා.''

මෙය ඇසෙන රංග සිලි සිලිගා සැලෙන කුඹුරු යාය දෙස බලන්නේ ගෙවී ගිය සොඳුරු අතීතය ආවර්ජනය කිරීමට.

''මම අද පුතාට ලස්සන කාර් එකක් ගෙනාවා. මෙන්න බලන්න.''

මෙය ඇසී එළියට පැමිණි චාලිස් මාමාට රංග වැන්දේ කුඩා කල දුන් ලී කාරය මතක් වීමෙන්.

''මාමාට මතකද මම එදා ලොකු කාර් එකක් ඉල්ලල අඬන කොට මට එදා දුන්න ලී කාරෙක. අපේ අම්ම ඒක තාමත් තියාගෙන ඉන්නව, මම පොඩි කාලෙ ඒක හරිම ආසාවෙන් තියාගත්ත කියල.''

*(පසු සටහන: මෙය සත්‍ය සිද්ධියක් පාදක කොට ගත් කතාවක් වුවත්, මෙහි එන නම් ගම් සියල්ල මනඃකල්පිතය.)*

**මහාචාර්ය පෙල්ටන් පීරිස්**



A Short Story
Charlis Mama
(Uncle Charles)
THE SINHALA
ISSN 1834-7061
August 2013
P8,9